# පවුල් සැලසුම් උපදේශනය සඳහා සැනපත් කට්ටලය (FP Flash Cards)

## භාවිතය සඳහා සේවා සපයනනන්ට උපදෙස්




මෙම සැනපත් කට්ටලය සිත් බඳනා අයුරින් ඉතා පැහැදිලිව නිමාකර පොතක ආකාරයට අමුණා ඇත.

- සැනපත් කට්ටලය භාවිතයේ ප්‍රධානම අරමුණ වන්නේ පවුල් සැලසුම් උපදේශන සේවා සැපයීමේදී මෙය උපයෝගී කොට සේවාලාභියා දැනුවත් කිරීම හා කැමති පවුල් සැලසුම් ක්‍රමයක් භාවිතය සඳහා ස්වාධීන තීරණයක් ගැනීමට ඉඩ සැලසීමයි.

- වඩාත් කැමති පවුල් සැලසුම් ක්‍රමයක් තෝරා ගෙන එය භාවිතා කිරීම සේවාලාභියාට සැපවත් නිරෝගී දිවි පෙවෙතකට මං සලසනු ඇත.

- මෙම සැනපත් විස්තර කරන විට අදාල පවුල් සැලසුම් උපකරණද ඔබ ළඟ තබාගෙන අවශ්‍ය අවස්ථාවලදී සේවාලාභියාට දැක ගැනීමට සැලැස්වීමෙන් උපදේශනය වඩාත් සාර්ථක වනු ඇත (ගිලින පෙති පැකැට්ටුවක්, අන්ත:ගර්භාෂිත තැන්පතුවක්, නික්ෂේපණ වයලයක්, හෝමෝන කරල් තැන්පතුවක් සහ කොන්ඩමයක් වැනි).

- මෙම සැනපත් කට්ටලයට මඳසරුභාවය පිළිබඳ පටුනක් අළුතින් ඇතුලත් කර ඇත. මෙම පටුනේ ප්‍රධාන අරමුණ වන්නේ මඳසරුභාවය පිළිබද සේවාලාභියා දැනුවත් කිරීම හා ඔවුන් නිසි පරීක්ෂණ හා ප්‍රතිකාර සදහා යොමු කිරීමයි.

**<u>පහත කණ්ඩායම් සදහා උපදේශන සේවා සැපයීමේදී ඔබට මෙම සැනපත් ප්‍රයෝජනයට ගත හැක.</u>**

01. ලිංගික සංසර්ගයේ යෙදෙන යුවලවල් හා පුද්ගලයින් (විවාහක, අවිවාහක)
02. යෝග්‍යතා පවුලක් ප.සෞ.සේ.නි. විසින් ලියාපදිංචි කළ විගසම
03. දරු පිළිසිඳ ගැනීමකට පෙර හා පසුව
04. දරු ප්‍රසුතියෙන් පසු මව්වරුන් සදහා
05. මඳසරුභාවය ඇති යුවල් සදහා
06. පහත සායන වලට සහභාගි වන සේවාලාභියන් සදහා
    a. පූර්ව ප්‍රසව සායනය
    b. පසු ප්‍රසව සායනය
    c. පවුල් සැලසුම් සායනය
    d. සුවනාරි සායනය
    e. මඳසරුභාවය සායනය